රෙජිස්ට්‍රාර් ජනරාල්,
චක්‍රලේඛ අංකය:- 03/2001.

මගේ අංකය:- එම්/10/01/2001.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 340, ආර්.ඒ.ද මැල් මාවත,
කොළඹ 03.
2001 ජූලි මස 26 දින.

සියළුම අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් හා
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**කල්ගත වූ උපත් ලියාපදිංචි කිරීම සහ අනුමාන වයස් සහතික නිකුත් කිරීම.**

කල්ගත වූ උපත් ලියාපදිංචි කිරීම සඳහා සාක්ෂි වශයෙන් දැනට ඉල්ලා සිටින ලියවිලි සංඛ්‍යාව අධික වීම නිසාත්, වාචික පරීක්ෂණයේ දී අවශ්‍යතාව ගැන නොසලකා සාක්ෂිකරුවන් වැඩි ගණනක් කැඳවීම නිසාත්, මහජනයා නොයෙකුත් අපහසුතාවයනට පත්වන බව පෙනී ගොස් ඇත. ඒ නිසාම කල්ගත වූ උපත් විධිමත්ව ලියාපදිංචි කර ගැනීමට මහජනයා උනන්දුවක් නොදක්වන බවත්, ඒ වෙනුවට වංචනිකව ව්‍යාජ උප්පැන්න සහතික සකස් කර ගැනීමට මහජනයා පෙළඹී ඇති බවත් අනාවරණය වේ. එබැවින් කල්ගත වූ උපත් විධිමත්ව ලියාපදිංචි කරවා ගැනීමට මහජනයා පෙළඹවීම සඳහාත්, ව්‍යාජ උප්පැන්න සහතික සකස් කිරීම වැළැක්වීම සඳහාත් කල්ගිය උපත් ලියාපදිංචි කිරීමේ පවත්නා ක්‍රමය වඩාත් සරල කිරීම හා පහසු කිරීම අත්‍යාවශ්‍ය වී තිබේ.

02. ඒ අනුව කල්ගත වූ උපත් ලියාපදිංචි කිරීම හා අනුමාන වයස් සහතික නිකුත් කිරීම පිළිබඳව මෙහි පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

03. <u>උපත සිදුවී අවුරුද්දක කාලය ගත වීමෙන් පසු ඉදිරිපත් කරන ප්‍රකාශපත්‍ර.</u>

3:1 <u>ප්‍රකාශපත්‍ර භාර ගැනීම.</u>

කල්ගත වූ උපතක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නිසි ලෙස සම්පූර්ණ කරන ලද 24 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශපත්‍රයක් භාරගන්න. ඒ සමඟ පහත සඳහන් ලියවිලි <u>පමණක්</u> ලබාගන්න.

(I) උපත ලියාපදිංචි වී නොමැති බවට සහතිකයක් (හිස් ප්‍රතිඵලය).
(II) විෂයයගේ සහෝදර/සහෝදරියන්ගේ ලැයිස්තුවක් (රෙජි/0808 ආකෘතිය භාවිතා කරන්න.)
(III) දෙමව්පියන් විවාහක නම්, ඔවුන්ගේ විවාහ සහතිකය.

(iv) පුද්ගලයාගේ උපත් දිනය හා ස්ථානය ඇතුළත් පහත සඳහන් ලියවිලිවලින් එකක්.

(අ) රෝහල් උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්.

(ආ) ග්‍රාම නිලධාරි වාර්තාව හෝ එහි සහතික පිටපතක්.

(ඇ) වතු උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්.

(ඈ) විත්තසු මාතාවගේ උපත් ලේඛනයේ පිටපතක්.

(v) ඉහත Iv උපජේදයේ සඳහන් ලියවිල්ලක් නැත්නම්, ඒ වෙනුවට පහත සඳහන් ලියවිලිවලින් එකක්.

(අ) උපත සිදුවූ දිනට ආසන්නයේ දී සකස් කරන ලද හඳහන හෝ වේලපත්කඩය.

(ආ) සෞඛ්‍ය වර්ධන සටහන.

(ඇ) බෞතිස්ම සහතිකය.

(ඈ) විෂය මුල්වරට පාසලට ඇතුළත් කිරීමේ ලේඛනයේ සහතික පිටපතක්.

(ඉ) ශිෂ්‍ය කාර්ය දර්ශනය.

(vI) මෙම ලියවිලි කිසිවක් ලබාගත නොහැකි නම්, ප්‍රකාශක දත්තා විස්තර පමණක් ඇතුළත් කරන ලද 24 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශපත්‍රයක් සහ මේ සමඟ ඇති ආදර්ශය (ඇමුණුම 01) අනුව සකස් කරන ලද ප්‍රකාශකගේ දිවුරුම් පෙත්සමක් ද භාර ගන්න.

3:2 ලේඛන සෙවීම.

I. ප්‍රකාශපත්‍රය සමඟ මෙහි පහත සඳහන් ලියවිල්ලක මුල් පිටපත ලැබී ඇත්නම්, උපත සිදුවූ දින සිට මාස තුනක කාලසීමාවකට අදාල ලේඛන සෙවීමේ ප්‍රතිඵලය ප්‍රමාණවත්ය.

(අ) රෝහල් උපත් වාර්තාව.
(ආ) ග්‍රාම නිලධාරි උපත් වාර්තාව.
(ඇ) වතු උපත් වාර්තාව.

II. එසේ නැත්නම් සහ උපත ලියාපදිංචි කළයුතු තැනැත්තාගේ වයස අවුරුදු 02 කට වැඩි නම්, උපත සිදුවූ දින සිට ඉදිරියට එක් අවුරුද්දක කාලයක් සඳහා ලේඛන සෙවීමේ වාර්තාවක් ලබාගන්න.

3:3 පරීක්ෂණ පැවැත්වීම.

ප්‍රකාශපත්‍රය භාරගත හැකි ඉක්මනින් ලුහුඩු වාචික පරීක්ෂණයක් පවත්වන්න. ඒ සඳහා පහත සඳහන් පුද්ගලයින් පමණක් සාක්ෂියට කැඳවන්න. සාක්ෂි ලබාගත යුත්තේ, "ඇමුණුම 02" නිර්දේශයේ සඳහන් කරුණු සනාථ කිරීම සඳහා පමණි.

I. විෂයගේ දෙමව්පියන් සිටී නම් ඔවුන්, ඔවුන් ජීවතුන් අතර නැත්නම් හෝ විදේශගත වී ඇත්නම්, ඔවුන්ගේ සහෝදරයෙක් හෝ සහෝදරියක්.

II. උප්පැන්නය ලියාපදිංචි කළයුතු පුද්ගලයා (විෂයය).

III. ප්‍රකාශපත්‍රය ඉදිරිපත් කරන්නේ මව හෝ පියා නොවේ නම්, ප්‍රකාශක.

IV. ප්‍රකාශපත්‍රය ඉදිරිපත් කරන්නේ, මව හෝ පියා නම්, උපත සම්බන්ධ තොරතුරු දන්නා විශ්වාසවන්ත එක් පුද්ගලයෙකු.

සැ.යු. 1. සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි ලියවිල්ලක් භාරගන්න. ඒ සඳහා ග්‍රාම නිලධාරි කැඳවීම අවශ්‍ය නැත.

2. ඉදිරිපත් කරන ලද ලියවිලි පිළිබඳ සැකයක් ඇත්නම්, පමණක් ඒවාට අදාල මුල් ලේඛන පරීක්ෂා කර බලන්න.

3:4 නිර්දේශ කිරීම.

I. ඉදිරිපත් වූ ලිඛිත හා වාචික සාක්ෂිවලින් ප්‍රකාශපත්‍රයේ සඳහන් සියළුම කරුණු සනාථ වන්නේ නම්, උපත ලියාපදිංචි කිරීම නිර්දේශ කරන්න. ("ඇමුණුම 02" ආදර්ශ ආකෘතිය භාවිතා කරන්න.)

II. එසේ නැත්නම්, සනාථවන කරුණු පමණක් ඇතුළත් කර අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම නිර්දේශ කරන්න. ("ඇමුණුම 03" ආදර්ශ ආකෘතිය භාවිතා කරන්න.)

3:5 අනුමැතිය සඳහා ලිපිගොනු කළාප කාර්යාලය වෙත යැවීම.

පරීක්ෂණය අවසන් වූ වහාම මෙහි පහත සඳහන් ලියවිලි ලිපිගොනුවක් ලෙසට සකස් කර කළාප කාර්යාලයට යවන්න.

I. සම්පූර්ණ කළ අංක 840 රෝහියෝ ආකෘතියේ පිටපත් දෙකක්.
II. ප්‍රකාශපත්‍රය.
III. පරීක්ෂණ සටහන් හා නිර්දේශය.
IV. ලබාගත් ලියවිලි (පැ.1, පැ.2, පැ.3, ............ යන ලකුණු යොදා අනු පිළිවෙලින්).

04....\

3:6 **උපත් ලියාපදිංචි කිරීමට අනුමැතිය දීම.**

I. උපත ලියාපදිංචි කිරීම අනුමත කළහොත්, උපත ලියාපදිංචි කිරීම සඳහා ප්‍රකාශපත්‍රය කෙළින්ම අදාල උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් වෙත යවනු ලැබේ. ඒ බව ප්‍රකාශකට දන්වනු ලැබේ.

II. එසේ නැතහොත් අනුමාන වයස් සහතිකයක් ප්‍රකාශක වෙත කෙළින්ම යවනු ලැබේ.

04. **උපත සිදුවී අවුරුද්දක් ඇතුළත ඉදිරිපත් කරන ප්‍රකාශපත්‍ර.**

4:1 **ප්‍රකාශපත්‍ර භාරගැනීම.**

24 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශපත්‍රය සමඟ පහත සඳහන් ලියවිලි පමණක් භාරගන්න.

I. දෙමව්පියන් විවාහක නම්, ඔවුන්ගේ විවාහ සහතිකය.

II. විෂයයාගේ උපන්දිනය හා ස්ථානය සනාථවන පහත සඳහන් ලියවිලිවලින් එකක්.

(අ) රෝහල් උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්.
(ආ) ග්‍රාම නිලධාරි උපත් වාර්තාව හෝ එහි සහතිකයේ පිටපතක්.
(ඇ) වතු උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්.
(ඈ) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සහතිකයක්.

4:2 **පරීක්ෂණ පැවැත්වීම.**

මෙම ප්‍රකාශපත්‍ර මත පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය නොවේ.

4:3 **අනුමැතිය දීම.**

මෙවැනි ප්‍රකාශපත්‍රවලට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ට සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ට අනුමැතිය දිය හැකිය. ඒවා කළාප කාර්යාල වෙත යැවීම අවශ්‍ය නොවේ.

4:4 **ලියාපදිංචි කිරීම.**

අනුමත කරන ලද ප්‍රකාශපත්‍රය උපත ලියාපදිංචි කිරීම සඳහා නියමිත කොට්ඨාශයේ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරයාට යවන්න. නොමිලේ නිකුත් කරන පිටපත ප්‍රකාශකට නිකුත් කරන මෙන් ද ඔහුට දන්වන්න. ඒ බව ප්‍රකාශකට ද දන්වන්න. මේ සඳහා රෝ/422 ආකෘතිපත්‍රය සුදුසු පරිදි භාවිතා කරන්න.

05. මෙම චක්‍රලේඛනයෙන් බලාපොරොත්තු වන්නේ, මහජන පහසුව සඳහා කල්ගත වූ උපත් ලියාපදිංචි කිරීමේ ක්‍රමය සරල කිරීමක් පමණි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ක්‍රමයෙහි <u>විශ්වාසනීයත්වයට හානියක් නොවිය යුතු බව විශේෂයෙන් දන්වමි.</u>

06. මෙහි සඳහන් උපදෙස් වහාම ක්‍රියාත්මක වේ.

මහින්ද රත්නායක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.- දැනගැනීම සඳහා.

2. සියළුම කළාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත.- දැනගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා.

3. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත, දැනගැනීම සඳහා.

4. මධ්‍යම ලේඛනාගාරයේ, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, දැනගැනීම සඳහා.

(ඇමුණුම 01)

## අනුමාන වයස් සහතිකය ලබාගැනීම සඳහා කරනු ලබන දිවුරුම් ප්‍රකාශය.

.................................................. පදිංචි

.................................................. වන මම ........... ආගමික වශයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස/දිවුරා ප්‍රකාශ කරමි.

01. මෙහි ප්‍රකාශක මම වෙමි.

02. මගේ/*ප්‍රකාශපත්‍රයේ සඳහන් .............................. නමැති විෂයයගේ/උපන් දිනය මා නොදන්නා බවද,

03. මා/*විෂයය/............. වර්ෂයේ දී ඉපදී ඇති බවද,

04. මාගේ/*විෂයයගේ/මවගේ සහ හෝ පියාගේ විස්තර මා දන්නා බවද/නොදන්නා බවද,

05. මාගේ/*විෂයයගේ/උප්පැන්නය මීට පෙර ලියාපදිංචි කර නැති බව මා හොඳාකාරවම දන්නා බවද,

මාගේ/*විෂයයගේ/අනාගත සුභ සිද්ධිය සඳහා මා/*ඔහු/ඇය/උපන් වර්ෂය .............. මෙන් ද, උපන් ස්ථානය ........................... මෙන් ද, නම ........ ......................... මෙන් ද, පියාගේ නම .................... .................... මෙන් ද, මවගේ නම ........................... ............... මෙන් ද ඇතුළත් කර අනුමාන වයස් සහතිකයක් නිකුත් කරන මෙන් මම මෙයින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිමි.

ප්‍රකාශකගේ අත්සන.
(රු.10/= මුද්දරය මත)

............... දින,

..................... දී මා ඉදිරියේ දී
අත්සන් කරන ලදී.

...................
සමාදාන විනිශ්චයකාර තැන.
(නිල මුද්‍රාව තබන්න)

* අදාල නොවන වචන කපා හරින්න.

(ඇමුණුම 02)

## කල්ගිය උපතක් ලියාපදිංචි කිරීම සඳහා යැවිය යුතු නිර්දේශයක ආදර්ශය.

01. මෙහි ප්‍රකාශක ........................................ වේ.
(විෂයගේ මව/පියා/භාරකරු/විෂය)

02. පරීක්ෂණයේ දී පහත සඳහන් අය සාක්ෂි දුන්හ.

ප්‍රකාශක:-

විෂයගේ දෙමව්පියන්/භාරකරු:-

විෂය ගැන දන්නා පුද්ගලයෙකු:- ..............................
(නම සඳහන් කරන්න)

03. විෂය මා ඉදිරියට පමුණුවන ලදි. ඔහු/ඇය පෙනුමෙන් වයස අවුරුදු .......... ක් පමණ වන පුරුෂයෙකි/ස්ත්‍රියෙකි.

04. විෂයගේ දෙමව්පියන් විවාහකය. විවාහ සහතිකය "පි 01" මෙන් ඉදිරිපත් වේ. දෙමව්පියන් අවිවාහකය. එහෙත් පිතෘත්වය භාරගනිමින් පියා ප්‍රකාශපත්‍රය අත්සන් කර ඇත.

05. මේ පවුලේ දරුවන් ........ කි. විෂය .......... වෙනි දරුවාය. දරු ලැයිස්තුව "පි 02" මෙන් ඉදිරිපත් වේ.

06. විෂයගේ උපන් දිනය හා උපන් ස්ථානය .................................. සනාථ වේ. (ලියවිල්ලේ විස්තර ඇතුළත් කරන්න)
එය "පි 03" මෙන් ඉදිරිපත් වේ. එය සත්‍ය ලියවිල්ලක් බවට මම සෑහීමකට පත් වෙමි.

07. මෙම උපන මීට පෙර ලියාපදිංචි වී නැත. ..................... කොට්ඨාශයේ, ................ දින සිට ............... දින දක්වා ලේඛන සෙවීමේ ප්‍රතිඵලය "පි 04" මෙන් ඉදිරිපත් වේ. ලේඛන සොයා ඇත්තේ නිවැරදි කොට්ඨාශයේය.

08. ප්‍රකාශපත්‍රයේ සඳහන් සියළුම විස්තරවල සත්‍යතාවය ඉදිරිපත් වී ඇති ලිඛිත සහ වාචික සාක්ෂිවලින් සනාථවන බවට මම සෑහීමකට පත් වෙමි. උපත ලියාපදිංචි කිරීම මම නිර්දේශ කරමි.

අත්සන:-

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/අතිරේක
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.
(නිල මුද්‍රාව තබන්න)

දිනය:-

කාර්යාලය:-

(ඇමුණුම 03)

## අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම සඳහා සැපයිය යුතු නිර්දේශයක ආදර්ශය.

01. මෙහි ප්‍රකාශක .............................................. වේ.
(විෂයගේ මව/පියා/භාරකරු/විෂය)

02. පරීක්ෂණයේ දී පහත සඳහන් අය සාක්ෂි දුන්හ.

ප්‍රකාශක:-

විෂය :-

විෂයගේ දෙමව්පියන්/භාරකරු:-

03. මා ඉදිරියේ පෙනී සිටි විෂය පෙනුමෙන් වයස අවුරුදු ......... ක් පමණ වන පුරුෂයෙකි/ස්ත්‍රියකි.

04. විෂයගේ දෙමව්පියන්ගේ විස්තර ලිඛිත සහ/ හෝ වාචික සාක්ෂි වලින් සනාථ වේ/සනාථ නොවේ.

05. විෂයගේ උපත් වර්ෂය සහ ස්ථානය ..................................
සනාථ වේ. (ලියවිල්ලේ විස්තරය ඇතුළත් කරන්න)

06. මෙම උපත මීට පෙර ලියාපදිංචි වී නැත.

07. "ඇමුණුම 01" ප්‍රකාශය අනුව විෂයගේ උපත් වර්ෂය ............... මෙන් ද, උපත් ස්ථානය .......................... මෙන් ද, නම .......... .......................... මෙන් ද, පියාගේ නම .......... .......................... මෙන් ද, මවගේ නම .............. .......................... මෙන් ද ඇතුළත් කර අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම මම නිර්දේශ කරමි.

අත්සන:-

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.
(නිල මුද්‍රාව තබන්න)

දිනය:-

කාර්යාලය:-